# දහම් පාසල් අවසාන විභාගය පසුගිය ප්‍රශ්න

## බුද්ධ චරිතය

### 05 වන පාඩම ; ශාක්‍ය කෝලීය සම්භවය

**[[ 2024/2025 ]]** 04 වන ප්‍රශ්නය

I සිද්ධාර්ථ කුමරුට පළමුවර නමස්කාර කළ දෙදෙනා නම් කර,ඔවුන් ලබා තිබූ ආධ්‍යාත්මික තත්ත්වයන් හා තනතුරු ලියා දක්වන්න.

II සර්වමිත්‍ර බමුණු ආචාර්යවරයා වෙතින් සිද්ධාර්ථ කුමරුන් හැදෑරූ ශිල්ප ශාස්ත්‍ර හතරක් ලියා දක්වන්න.

**[[ 2020/2021/2022/2023 ]]** 04 වන ප්‍රශ්නය

I ශාක්‍යයන්ගේ හා කෝලීයයන්ගේ අගනගර ගෙන හැර දක්වා,එම රාජ පරම්පරා දෙකෙහි ආදී පුරුෂයන් නම් කරන්න.

II ශාක්‍යරාජ පරපුරේ සිංහහනු හා කාංචනා යන රජ යුවළට අයත් පුතණුවරුන් සිව්දෙනෙකු ලියා දක්වන්න.

III කෝලීය රාජ පරපුරේ ආරම්භය පිළිබඳ පුරාවෘත්තය කෙටියෙන් දක්වා කෝලීය පරපුරේ රජවරුන් ශාක්‍ය වංශිකයන් සමඟ ඇතිකරගත් විවාහ ඥාති සබඳතා සඳහන් කරන්න.

IV ශාක්‍ය හා කෝලීය රාජ පරම්පරා දෙක බෝසත් හා බුදුසිරිත සමඟ සම්බන්ධවන අවස්ථා තුනක් දක්වන්න.

**[[ 2018/2019 ]]** 04 වන ප්‍රශ්නය

I සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, නම් තැබීම, වප්මඟුල් උත්සවය, විවාහය හා ශිල්ප දැක්වීම යන අවස්ථාවල වැදගත් සිදුවීම් පෙන්වා දෙන්න.

II සිදුහත් බෝසත් චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ හතරක් දක්වන්න.

**[[ 2017/2018 ]]** 05 වන ප්‍රශ්නය

I කපිලවස්තු නුවර ශාක්‍ය රජ පරපුරේ සිංහහනු රජුගේ දූදරුවන් අතුරින් හතර දෙනෙකු නම් කරන්න.

II කෝලීය අගනගරය ,එහි ආරම්භක රජු හා ඔහුගේ පුතණුවන් දෙපළ නම් කරන්න.

III සිද්ධාර්ථ කුමරු අයත් වන ශාක්‍ය රජ පරපුර පිළිබඳව කෙටියෙන් අදහස් පල කරන්න.

**[[ 2016/2017 ]]** 04 වන ප්‍රශ්නය

I සිදුහත් කුමරුගේ නම් තැබීමේ උත්සවයට සහභාගීවූ උගත් පඬිවරුන් අතරින් හතරක් නම් කරන්න.

II සුදොවුන් රජු සිදුහත් කුමරුට නමස්කාර කළ අවශ්ථා දෙකක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

[[ 2015/2016 ]] 04 වන ප්‍රශ්නය

I ශාක්‍ය රාජ පරපුරේ සිංහහනු රජතුමාගේ දූ දරුවන් අතුරින් සිව්දෙනෙකු නම් කරන්න.

II කෝලීය රජ පරපුරේ අංජන රජතුමාගේ දූදරුවන් අතුරින් සිව් දෙනෙකු ලියා දක්වන්න.

III කෝලීය රාජ පරපුරේ ඓතිහාසික පසුබිම කෙටියෙන් පෙන්වා දෙන්න.

IV ශාක්‍ය හා කෝලීය රාජ පරම්පරා දෙක බෝසත් හා බුදුසිරිත සමඟ සම්බන්ධවන අවශ්ථා ප්‍රකට කරන්න.

[[ 2014/2015 ]] 04 වන ප්‍රශ්නය

I රෝහිණී නදිය දෙපස පැවති ජනපද දෙක හා ඒවායෙහි අගනුවර දෙක නම් කරන්න.

II සිදුහත් කුමරුගේ නම් තැබීමේ උත්සවයට සහභාගී වූ ප්‍රකට පඬිවරු හතර දෙනෙකුගේ නම් ලියන්න.

III ශාක්‍යයන්ගේ මානය බිඳහෙළීම සඳහා අනුගමනය කළ ක්‍රියා මාර්ගය පැහැදිලි කරන්න.

[[ 2013/2014 ]] 04 වන ප්‍රශ්නය

I සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය, නම් තැබීම,වප්මඟුල් උත්සවය,ශිල්ප දැක්වීම හා විවාහය යන වැදගත් සිදුවීම් පෙන්වා දෙන්න.

II සිදුහත් බෝසත් චරිතයෙන් අපට ගත හැකි ආදර්ශ දක්වන්න.

[[ 2012/2013 ]] 01 වන ප්‍රශ්නය

I සිදුහත් බෝසතාණන්ගේ පියාගේ නමත්, පරපුරත්, අගනුවරත්, පියාගේ පියා(සීයාගේ) නමත් සඳහන් කරන්න.

II සිදුහත් බෝසතාණන්ගේ මවගේ නමත්,පරපුරත්,අගනුවරත්,මවගේ පියාගේ නමත් සඳහන් කරන්න.

III බෝසත් උපත,අසිත තවුසා හමුවීම හා නම් තැබීම යන සිදුවීම් කෙටියෙන් විස්තර කරන්න.

IV වප්මඟුල් උත්සවය සිදුහත් කුමරුගේ ශිල්ප ඉගෙනීම හා විවාහය යන සිදුවීම් කෙටියෙන් විස්තර කරන්න.

[[ 2011/2012 ]]] 01 වන ප්‍රශ්නය

I බෝසතාණන් මව් කුස පිළිසිඳ ගත්තේ කිනම් පෝය දිනයකද?

II බෝසතාණන්ගේ උපත සිදුවූයේ කිනම් පෝය දවසකද?

III බෝසතුන් මව් කුස පිළිසිඳ ගැනීමේ සිට අභිනිෂ්ක්‍රමණය තෙක් විශේෂ අවශ්ථා තුනක් කෙටියෙන් විස්තර කරන්න.

IV බෝසතාණන්ට නම් තැබීමට පැමිණි පඬිවරු අට දෙනා නම් කර,ඔවුන්ගේ නිගමන කෙටියෙන් දක්වන්න.

[[ 2008/2009 ]] 04 වන ප්‍රශ්නය

I සිදුහත් කුමරුට නම් තැබීමට පැමිණි පඬිවරුන් අට දෙනා නම් කරන්න.
II සිදුහත් කුමරුට ධර්ම ශාස්ත්‍ර හා ශිල්ප ඉගැන්වූ පඬිවරයා හැඳින්වුණු නම් දෙක දක්වන්න.
III අභිනිෂ්ක්‍රමණයෙන් පසු බෝසතාණන් එවකට සිටි දාර්ශනිකයන් වෙතින් ලත් දාර්ශනික දැනුම හා එකී ආචාර්යවරුන්ගේ නම් පිළිබඳව අනුපිළිවෙළින් විස්තර කරන්න.
IV දුශ්කර ක්‍රියා පිළිබඳව විස්තර කොට, " සිදුහත් තවුසාණන් දුශ්කර ක්‍රියා අත්හලේ එහි අනාර්ය බව ප්‍රත්‍යක්ෂ ලෙස වටහා ගැනීමෙනි." යන කියමන තහවුරු කරන්න.

[[[[[ 2005 ]]]]] 04 වන ප්‍රශ්නය

I සිදුහත් කුමරුගේ මව්පිය දෙපසේ වංශකතා සැකෙවින් දක්වන්න.
II උපතේ සිට ශිල්ප දැක්වීමේ පුවතේ අවසානය තෙක් බෝසත් සිරිත චිත්‍රණය කරන්න.
III බෝසතාණන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණයට පසුබිම සකස් වූ ආකාරය විස්තර කරන්න.

[[[[[ 2003 ]]]]] 04 වන ප්‍රශ්නය

I කපිලවස්තු පුරය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න.
II ශාක්‍ය පෙළපත සම්බන්ධ පුරාවෘත්තය විස්තර කරන්න.

[[[[[ 1996 ]]]]] 11 වන ප්‍රශ්නය (කෙටි සටහන් ලිවීම)

අසිත තාපසතුමා